**විසල් ත්‍රිකුණාමලය ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය - 2014**

---

විසල් ත්‍රිකුණාමලය ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ එජන්ස් ෆ්‍රාන්ෂයිස් ඩී ඩිවලොප්මන්ට් අතර 2005 ඔක්තෝබර් 05 දින එළඹි අංක සීඑල්කේ 3000 01 එච් දරන ණය ගිවිසුමේ II වගන්තියේ 8 ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය**

---

විසල් ත්‍රිකුණාමලය ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට ජල සම්පාදන හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කන්තලේ, තඹලගමුව, කින්නියා, ත්‍රිකුණාමලය නගරය හා කඩවත් සතර සහ කුච්චවේලි උතුර යන ප්‍රදේශවල දැනට පවත්නා 17,000 ක මට්ටමේ සිට සැපයුම් සම්බන්ධතා සංඛ්‍යාව 61,500 ක් දක්වා වැඩි කිරීම මඟින් ආරක්ෂිත පානීය ජලය සැපයීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 4,650.25 කට සමාන යූරෝ මිලියන 29.63 ක් වන අතර, ඉන් රු.මිලියන 1,500.75 කට සමාන යූරෝ මිලියන 10.35 ක් සහ රු.මිලියන 1,650 කට සමාන යූරෝ මිලියන 10 ක් මූල්‍යායනය කිරීමට පිළිවෙලින් ඒජන්ස් ෆ්‍රාන්ෂයිස් ඩි ඩිවොලප්මන්ට් ඔෆ් ෆ්‍රාන්ස් හා රිසර්ව් පේස් ඉමර්ජන්ට්ස් - ෆ්‍රෙන්ච් ප්‍රොටෝකෝල් (**Reserve Pays Emergents French Protocol**) එකඟ වී තිබුණි. කෙසේ වුවද පිරිවැය ඉක්මවා යාම හේතුවෙන් රු.මිලියන 412.5 කට සමාන යූරෝ මිලියන 2.5 ක අතිරේක වෙන්කිරීමක් ලබාදීමට රිසර්ව් පේස් ඉමර්ජන්ට්ස් - ෆ්‍රෙන්ච් ප්‍රොටෝකෝල් එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කාර්යයන් 2006 පෙබරවාරි මාසයේදී ආරම්භ කර තිබූ අතර 2010 නොවැම්බර් අවසානය වන විට නිම කිරීමට ආරම්භකව සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2015 අගෝස්තු 31 දක්වා අවස්ථා 03 කදී දීර්ඝ කර තිබුණි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය

ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂයන්, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ණය ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

---------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

### 2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ල ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව.

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

ජල සම්පාදන මණ්ඩලයේ - ත්‍රිකුණාමලය ප්‍රාදේශීය සේවා මධ්‍යස්ථාන කාර්යාලයට තාවකාලිකව මාරු කරන ලද රු.මිලියන 60.89 ක් වටිනා ඉදිකිරීම් ද්‍රව්‍ය ව්‍යාපෘතිය විසින් ගිණුම්ගත කර නොතිබුණි. එබැවින් 2014 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ වටිනාකම වැඩියෙන් දක්වා තිබූ අතර ලැබිය යුතු ගිණුම් එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

#### 2.2.2 නොසැසඳූ ශේෂ

------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, රිසර්ව් පේස් ඉමර්ජන්ට් (Reserve Pays Emergents) වෙතින් ලැබුණු රු.මිලියන 70 ක් ව්‍යාපෘති කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා 2014 වර්ෂය තුළදී ප්‍රේෂණය කර තිබුණි. කෙසේ වුවද එය ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල රු.මිලියන 108.69 ක් ලෙස දක්වා තිබුණි. රු.මිලියන 38.69 ක වෙනස සසඳා ඒ අනුව ගිණුම්වල ගැලපීම් කර නොතිබුණි.

(ආ) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, 2014 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ වටිනාකම රු.මිලියන 4,250.02 ක් විය. කෙසේ වුවද ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන අනුව, එය රු.මිලියන 4,851.65 ක් ලෙස දක්වා තිබූ අතර රු.මිලියන 601.63 ක් වූ වෙනස සසඳා ඒ අනුව ගිණුම්වල ගැලපීම් කර නොතිබුණි.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

ලැබුණු තොරතුරු අනුව, කොන්ත්‍රාත්කරු විසින් ලබාදෙන ලද රු.මිලියන 2.5 කට සමාන යූරෝ මිලියන 14,129 ක් වූ වට්ටම් මුදලක් 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි. කෙසේ වුවද ඒ පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2.2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) 2010 ජූලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය අනුව ව්‍යාපෘතියේ ගනුදෙනු අභ්‍යන්තර විගණනයකට භාජනය කර නොතිබුණි.

(ආ) 2005 අංක 05 දරන මුදල් පනතේ 03 වගන්තියේ දක්වා ඇති පරිදි කොන්ත්‍රාත් ගෙවීම් මත දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට ප්‍රේෂණය කළ යුතු සියයට 1 ක ඉදිකිරීම් කර්මාන්ත සහතික බදු, ව්‍යාපෘතිය විසින් 2014 දෙසැම්බර් 31 දිනට කරන ලද රු.මිලියන 25.3 ක මුළු කොන්ත්‍රාත් ගෙවීම් වලින් අඩුකර ප්‍රේෂණය කර නොතිබුණි.

**2.2.5 පෙර විගණනයේදී පෙන්වා දෙන ලද නිරවුල් නොවූ විගණන කරුණු**

ජල තුළු මහ 02 ක් සහ ජලය පිරිසිදු කිරීම් පිරියත 1 ක් සඳහා විදුලිය සැපයීම වෙනුවෙන් ලංකා විදුලිබල මණ්ඩලයේ තබන ලද රු.මිලියන 6.91 ක් වටිනා ආරක්ෂිත තැන්පතු පෙර වර්ෂයේ වියදමක් ලෙස ලියාහැර තිබූ අතර මෙම දෝෂය නිවැරදි කිරීම සඳහා කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2014 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණයගිවිසුමේ මූල්‍යායනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දිනට | |
| | යූරෝ මිලියන | රු.මිලියන | රු.මිලියන | යූරෝ මිලියන | රු.මිලියන | යූරෝ මිලියන | රු.මිලියන |
| ඒඑෆ්ඩී | 10.35 | 1,500.75 | 40.00 | 0.23 | 39.75 | 10.20 | 1,637.07 |
| ආර්පීඊ | 12.50 | 2,062.50 | 70.00 | 0.62 | 108.69 | 10.87 | 1,778.05 |
| ශ්‍රීලංර | 6.78 | 1,087.00 | 80.00 | 0.44 | 76.83 | 9.03 | 1,465.61 |
| එකතුව | 29.63 | 4,650.25 | 190.00 | 1.29 | 225.27 | 30.10 | 4,880.73 |

**3.2 භෞතික කාර්යසාධනය**

විගණනයට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව අනුව, තුළු මහ (intakes) ඉදිකිරීම්, පොම්පාගාර ඉදිකිරීම් හා ජලාශ පුනරුත්ථාපනය කිරීම සහ ත්‍රිකුණාමලය කන්තලේ හා වෙල්ලමනාල් හි ජලනළ එළීම යනාදී ව්‍යාපෘතියේ කාර්යයන් 2014 අගෝස්තු 31 දිනට සම්පූර්ණ කර තිබුණි. ඉන් ඉහත සඳහන් පුනරුත්ථාපන කාර්යයන් යටතේ ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් 03 ක් යටතේ වැඩ මාස 12 සිට මාස 46 දක්වා ප්‍රමාදයන් සහිතව සම්පූර්ණ කර තිබුණි. කොන්ත්‍රාත්කරුට ඉදිකිරීම් වැඩ බිම් භාරදීමේ ප්‍රමාදයන් හේතුවෙන් නිම කිරීමට අපේක්ෂිත දිනයේ සිට මාස 14 කට වැඩි ප්‍රමාදයන් සහිතව ඉතිරි වැඩ එනම් කින්නියාහි ජලනළ එළීම් ආදිය 2014 දෙසැම්බර් 31 දිනට බොහෝදුරට නිමකර තිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

තුළුමහ (intake) පොම්පාගාර ඉදිකිරීම් වැඩ හා ජලාශ පුනරුත්ථාපනය කිරීම සඳහා යොදා ගැනීමට ප්‍රසම්පාදනය කරන ලද ෆොලෝ මීටර් (Flow Meter) 1 ක් සහ මඩ් සෙන්සර් 2 ක් (mud sensor) සඳහා 2013 වර්ෂයේදී රු.මිලියන 4.2 ක මුදලක් ගෙවා තිබූ අතර විදුලි සැපයුම නොමැති වීම හේතුවෙන් එම උපකරණ 2015 දෙසැම්බර් 31 දක්වා අරමුණ කළ කාර්යයන් සඳහා උපයෝජනය කර නොතිබුණි.

**3.4 මතභේදයට තුඩුදෙන කරුණු**

ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සාමාන්‍ය පරිපාලන කටයුතු සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සිටියද, පරිවයක් වශයෙන් ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලය සඳහා පාරිශ්‍රමික ගණනය කිරීම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිදුකරන අතර ඒ සඳහා සියයට 20 ක පොදු කාර්ය පිරිවැයක්ද අයකරනු ලැබේ. එබැවින් මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු මුදල් වලින් සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 2.56 ක්වූ පොදු කාර්ය ගාස්තුවක් ව්‍යාපෘතියට වැය කිරීමට සිදු වී තිබුණි.